# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,314 - 2023 ජනවාරි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 02 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජනවාරි මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජනවාරි මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1- B 082416— 353 (2023/01)
D 1 -

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

කොළඹ 10, ඩීන්ස් පාර, අංක 400 දරන ස්ථානයේ තම ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන එනර්ජිනෙට් (ප්‍රයිවට්) ලිමිටඩ් Energynet (Private) Limited (PV 6443) සම්බන්ධ කාරණයේ දී ය.

නඩු අංකය : 64/2022/CO
ස්වභාවය : ඈවර කිරීම
පටිපාටිය : ලඝු

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටසේ 270 වගන්තිය යටතේ ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධ කාරණයේ දී ය.

කෝමාර්ක් ඉන්ජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
COMARK ENGINEERS (PRIVATE) LIMITED,
1 වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල,
අංක 321, ගාලු පාර,
කොළඹ 03.

..........................*පෙත්සම්කරු.*

කොළඹ 10, ඩීන්ස් පාර, අංක 400 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය එනර්ජිනෙට් (ප්‍රයිවට්) ලිමිටඩ් Energynet (Private) Limited (PV 6443) ගණන් බේරා වසා දැමීම සඳහා 2022 නොවැම්බර් මස 30 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2023 පෙබරවාරි මස 15 වන දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දයකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණය හිමියෙකු හෝ දයකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබා ගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කළේ,

නීතිඥ රංගිකා කුමාරපේලි මෙනවිය,
අංක 152/1/13, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

*සටහන.-* මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ රංගිකා කුමාරපේලි මෙනවිය වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, 2023.02.14 වැනි දින පස්වරු 4.00ට පෙර බාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

කේ. ඒ. ඩී. ඩී. රංගිකා කුමාරපේලි,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

01-22

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2023.01.05 | බ්‍රහස්පතින්දා | 2022.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.13 | සිකුරාදා | 2022.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.20 | සිකුරාදා | 2023.01.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.01.27 | සිකුරාදා | 2023.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2023.02.03 | සිකුරාදා | 2023.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.10 | සිකුරාදා | 2023.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.17 | සිකුරාදා | 2023.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.24 | සිකුරාදා | 2023.02.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2023.03.03 | සිකුරාදා | 2023.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.10 | සිකුරාදා | 2023.02.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.17 | සිකුරාදා | 2023.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.24 | සිකුරාදා | 2023.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.31 | සිකුරාදා | 2023.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.